ආඛ්‍යාන Narrations
Volume 03 | Issue 01&02 | 2018 | Article 03
ISBN 2478-0642

On-line Refereed Journal of the Center for Indigenous Knowledge and Community Studies
Sabaragamuwa University of Sri Lanka

Follow this and additional works at: www.sab.ac.lk
e-mail: akyanaeditor@ssl.sab.ac.lk



# කිරි පෝය ශාන්තිකර්මය පිළිබඳ සමාජවිද්‍යාත්මක විමර්ශනයක්

නාලක ජයසේන[62]
nalakadhamma@gmail.com
BA(SP), MPhil (Reading)

**සාරසංක්ෂේපය**

මානවයා ස්වකීය ජීවන ආශ මස්තකප්‍රාප්ත කර ගැනීමට බහුවිධ ප්‍රවේශ අනුගමනය කිරීම ඉතිහාසයේ සිට නූතන සුහුරු යුගය දක්වාම සනාතනික ධර්මතාවකි. එහිලා ආගමික විශ්වාස අරබයා ලැබෙන ආස්ථානය ඉහළ අගයකින් යුතුය. සංස්කෘතිකව තමාට ලැබී ඇති ආගමික හරපද්ධතිය සහ ඊට ආනුශංගික පිළිවෙත් ඉටුකරමින් ඓහලෞකික හා පාරභෞතික ලෝකය සමග සම්බන්ධතා ගොඩනගා ගැනීම දැකිය හැකිය. කාලය සහ අවකාශයට සාපේක්ෂ විවිධ අභිචාර, විශ්වාස යනාදිය එම අභිලාෂ සමග ප්‍රතිබද්ධ වෙයි. භූගෝලමය සහ ප්‍රදේශමය විවිධත්වයක්ද එම අභිචාර විෂයක දැකිය හැකිය. දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තර ගංගාව සහ ගිං ගංගාව අතර මුහුදාසන්න කලාපයේ දැකිය හැකි කිරිපෝය ශාන්තිකර්මය එවැන්නකි. කුලමය පදනමක්ද සහිත එය කතරගම දෙවියන් සාර්ව වශයෙන්ද දෙවොල්, ගම්භාර, දැඩිමුණ්ඩ සහ පත්තිනි යන දෙවි දේවතාවුන් ක්ෂුද්‍ර වශයෙන්ද වන්දනයට පාත්‍ර කරමින් සිදු කරනු ලබන උළෙලකි. සෑම වසරකම ඇසළ හෝ නිකිණි පෝ දෙදිනෙන් එක් දිනෙක ඉටු කරනු ලබන එම චාරිත්‍රය ගමේ දේවාලය/කෝවිල සහ නිවස ආශ්‍රිතව සිදු කරන්නකි. සමාජවිද්‍යාත්මකව නිරික්සන කල එය සමාජ සුකෘත්‍යක් ඉටු කරන්නක් සේම බුද්ධාගම සහ දේවාගම අතර අතිපිහිතබව දැකිය හැකි අවස්ථාවකි. කිරිපෝය, සුද්දෙ පෝය, දෙල්පෝය යනාදි නම් කිහිපයකින් හඳුන්වනු ලබන මෙම ශාන්තිකර්මය පිළිබඳ සිදු කෙරුණු අධ්‍යයනද විරලය. මෙම පත්‍රිකාව ඔස්සේ එම උළෙලෙහි සාර්ව හා ක්ෂුද්‍ර බලපෑම් වාස්තවික හා මනෝමූලික යන ප්‍රවේශද්වයෙන්ම පරීක්ෂා කරනු ලැබෙයි.

ප්‍රමුඛ පද: කතරගම දෙවියන්, කිරි පෝය, දේව දානය, ජෝරා මැරීම, සලාගම කුලය

[62] Former assistant lecturer - University of Colombo.

**අධ්‍යයනයේ අරමුණ සහ ක්ෂේත්‍රය**

සිංහල සමාජය බෞද්ධ හර පද්ධතිය මත පදනම් වුවද බෞද්ධ දර්ශනයේ ඇති නිදහස කරණ කොට ගෙන විවිධ ජන ඇදහිලි හා විශ්වාස අනුගමනය කරන්නට නොපැකිළෙන අතුරු සංස්කෘතික මාවතකට ප්‍රවිශ්ටවන ගුණයෙන් යුතුය. කිරිපෝය යනු එවැනි එක් අභිචාරයකි. එහි විශේෂත්වය නම් එක් ප්‍රදේශයකට පමණක් සීමා වූ එහෙත් එම ප්‍රදේශයේ සියලු දෙනාම එක්සිත්ව සිදුකරනු ලබන ශාන්තිකර්මයක් වීමයි. මෙම අධ්‍යයනයේ අරමුණ කිරිපෝයෙහි ප්‍රභවය සහ එහි භාවිතය පිළිබඳ යම්කිසි සමාජවිද්‍යාත්මක විමර්ශනයක් සිදුකිරීමයි. මෙහිලා සහභාගිත්ව නිරීක්ෂණ ක්‍රමවේදය අනුගමනය කරනු ලබන අතර පර්යේෂකයා එම ශාන්තිකර්මය ජීවිත කාලය පුරා ඉටු කර තිබීම පර්යේෂණයේ ශක්‍යතාවක් වශයෙන් හඳුනා ගැනෙයි. පර්යේෂණයේ සීමාව වන්නේ ශාන්තිකර්මය සිදුකරනු ලබන එක් දේවාලයක් පමණ තෝරා ගැනීමයි. ඒ අනුව බළපිටිය පුරාණ මෝදර දේවාලය පර්යේෂණ ක්ෂේත්‍රය වශයෙන් තෝරා ගැනෙයි. කතරගම දෙවියන් ඇතුළු දෙවිවරු කිහිප දෙනෙක් වැඩ සිටින මෙම දේවාලය අතීතයේ මුහුද අසළ තිබී ඇති අතර පසුකාලීනව ගොඩබිමට ගෙනැවිත් ඇති බව ජනප්‍රවාදයයි. අද වනවිට බළපිටියේ පමණක් නොව අවට ගම්නගරවාසීන්ගේද සිද්ධස්ථානයක් බවට එය පත්ව ඇත. මෙම පත්‍රිකාව මගින් විභාග කරනුයේ කිරිපෝය තදාශ්‍රිත ක්‍රියාපිළිවෙත්හි සමාජ බලපෑම බැවින් පර්යේෂණ ගැටලුවක් මෙහිදී විසර්ජනය නොකෙරෙයි. එබැවින් කිරිපෝය හා සබැඳි ක්‍රියාකාරකම් විශ්ලේෂණය පිණිස ජෝර්ජ් රයිට්සර් විසින් ඉදිරිපත් කරන ලද සමාජ විශ්ලේෂණ න්‍යාය උපයෝගී කර ගැනෙයි. පර්යේෂණ සාහිත්‍ය විමර්ශනයේදී මේ සම්බන්ධ ප්‍රාථමික මූලාශ්‍රය නොමැති තරම්ය. හේතුව නම් මෙම ප්‍රාදේශීය ශාන්තිකර්මය පිළිබඳ සිදුකරනු ලැබූ දීර්ඝ හෝ ගැඹුරු අධ්‍යයන නොමැති වීමය. පර්යේෂකයා විසින් ජනශ්‍රැති අධ්‍යයන පර්යේෂණ සමුළුවකට කිරි පෝය ගැන ඉදිරිපත් කරනු ලැබූ පත්‍රිකාවක් සහ තවත් පර්යේෂිකාවක් ඉදිරිපත් කර ඇති සාරසංක්ෂේපයක් පමණක් ශාස්ත්‍රීය විමර්ශන වශයෙන් හඳුනා ගැනීමට හැකිවිය. මෙම උළෙල ජනමාධ්‍යයේද නිසි අවධානයට යොමුව නැති අතර පර්යේෂකයා විසින් සම්පාදිත පුවත්පත් ලිපියකට අමතරව තවත් පුවත්පත් ලිපි දෙකක් පමණක් මෙම පත්‍රිකාවෙහිලා පරිශීලනය කෙරෙයි. ද්විතීයික මූලාශ්‍රය වශයෙන් කිරිපෝය අභිචාරය සම්බන්ධ සමාජවිද්‍යාත්මක විවරණ පිණිස සෛද්ධාන්තික කරුණු අන්තර්ගත විද්වත් අදහස් උපයෝගී කර ගැනෙයි.

පර්යේෂණයේ සෛද්ධාන්තික රාමුව වශයෙන් ජෝර්ජ් රයිට්සර් විසින් ඉදිරිපත් කරන ලද සමාජ විශ්ලේෂණ න්‍යාය යොදා ගැනෙයි.

මහේක්ෂ (macroscopic)

| | | | |
|---|---|---|---|
| වාස්තවික (objective) | සාර්ව වාස්තවික (macro-bjective) | සාර්ව මනෝමූලික (macro-subjective) | මනෝමූලික (subjective) |
| | ක්ෂුද්‍ර වාස්තවික ( micro-bjective) | ක්ෂුද්‍ර මනෝමූලික (micro-subjective) | |

සූක්ෂ්ම (microscopic)

**සාකච්ඡාව**

පොහෝ දිනයක මෙරට කිසිදු පන්සලක් හිස් වන්නේ නැත. එහෙත් දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තර ගඟේ සිට ගිංගඟ දක්වා මුහුදු ආශ්‍රිත ප්‍රදේශවල කිරිපෝයදාට පන්සල්වල සිල්ගන්නා අය විරලය. එය සුවිශේෂ අවස්ථාවකි. කිරිපෝය ලෙස සලකනු ලබන්නේ සිංහල අවුරුද්ද ගෙවීගොස් එළඹෙන හතරවන පෝ දිනයයි. ඒ අනුව සිංහල අවුරුද්දට පෙර බක් පෝය පැවතුණහොත් ඇසළ මාසයේද අවුරුද්දට පසුව බක් පෝය යෙදුණොත් නිකිණි මාසයේද කිරි පෝය යෙදෙයි. බළපිටිය කොස්ගොඩ නගර ආසන්නයේම පමණක් දේවාල හතලිහකට ආසන්න සංඛ්‍යාවක් ඇත. ඒ අනුව මෙම කිරි පෝය ආශ්‍රිත අභිචාර මෙම ප්‍රදේශයේ ජනජීවිතය සමග

සාකල්‍යයෙන්ම හා අත්‍යන්තයෙන්ම ප්‍රතිබද්ධව ඇත. සිංහල අලුත් අවුරුද්දට ජන සමාජය සූදානම් වන්නේ යම් සේද ඒ හා සමාන කැපවීමකින් සහ එයද ඉක්මවා යන භක්තියකින් මේ සඳහා ජන සමාජය යොමු වීම දැකිය හැකිය. සමාජවිද්‍යාත්මකව උත්සව ප්‍රවර්ග දෙකකි. එනම් ජීවිත ප්‍රතිසංස්කරණ උත්සව සහ සමාජ ප්‍රතිසංස්කරණ උත්සව වශයෙනි. පළමු ප්‍රවර්ගය පෞද්ගලික පදනමින්ද දෙවැනි ප්‍රවර්ගය පොදු පදනමින්ද ක්‍රියාත්මක වෙයි. එනයින් ගත්කල කිරි පෝය වනාහී සමාජ ප්‍රතිසංස්කරණ උත්සවයකි. මෙම පොහෝ දින සන්ධ්‍යාවේ කොළඹ ගාල්ල දුම්රිය හෝ මහා මාර්ගයේ ගමන් ගන්නා මඟීන්ට නිවෙස් ඉදිරිපිට තැනූ පහන් පැල් දැකගත හැකිය. එය ඔවුනට විශේෂ අත්දැකීමක් වනු නිරනුමානය. එසේම එම පෝදින රාත්‍රියේ නිවසට අමුත්තන් පැමිණියේ නම් ඔවුනටද සංග්‍රහ පිණිස හිමිවන්නේ මෙම අවස්ථාවේ නිවෙස්වල සකසනු ලබන දේව දානයයි. සමාජානුයෝජනය වෙමින් අනාදිමත් කාලයක සිට පැවතෙන මෙම සිරිත තරගකාරී හා සුහුරුකරණය වී ඇති වත්මන් සමාජයේද උද්යෝගයෙන් සැමරීම මනෝමූලිකව විභාග කළ යුතුය. මක්නිසාදයත් ගම්බිම්වලින් බැහැර කොළඹ සහ වෙනත් ප්‍රදේශවල සේවය කරන පිරිස් සේම ආවාහ විවාහාදියෙන් දුර බැහැර සිටින පිරිස්ද මේ වෙනුවෙන්ම ගම්රට බලා පැමිණෙන බැවින්ය.

**කිරිපෝය ප්‍රභවය**

මෙම අභිචාරයෙහි සමාරම්භය පිළිබඳ ලිඛිත මූලාශ්‍රයක් නැත. එය පරම්පරාවෙන් පරම්පරාවට සමාජානුයෝජනයෙන් ලැබුණු ග්‍රාම උළෙලක් බැවින් එහි ප්‍රභවය පිළිබඳ සොයැගැනීමට ජනශ්‍රැතිය මත පදනම් විය යුතුය. ඒ අනුව ගත් කල මේ දේවපතිරාජ නම් අමාත්‍යවරයකුගේ යුද්ධ ජයග්‍රහණයක් දක්වා දිවෙන බව උපමාන කළ හැකිය. දඹදෙණි යුගයේ රජකළ දෙවන පරාක්‍රමබාහු රජතුමාගේ අග්‍රාමාත්‍යවරයාව සිටි පතිරාජ දේව හෙවත් දේවපතිරාජයන් විසින් කේරළයේ සිට පැමිණි කේරළ හමුදාව පරාජය කරමින් ලද ජයග්‍රහණය එම සංසිද්ධියයි. කේරළයේ සිට පැමිණි සේනා මෙබිමට ගොඩබැස ඇත්තේ වැලිතොටිනි. වත්මනේ බළපිටිය ලෙස හැඳින්වෙන්නේ එම ප්‍රදේශයයි. බළපිටිය යන වචනයේ නිරුක්තියද බළ සේනාවක් සමග සබැඳෙයි. දේවපතිරාජ අමාත්‍යවරයා සිදුකළ සටන පිළිබඳ සිදත් සඟරාවේ දැක්වෙන්නේ පහත පරිදිය.

සඳවත සිඳු කිය කුඹුයොන නම සත රා
කිවි සෙවෙත තොද වැලිනි යළ තො ගො රා
අරුණ කිහෙනි ව කෙරළන් ලැබැ හුරි රා
පැටිව නොදෙය යුද පතිරජ දිය ඉසු රා

මෙම කවියෙන් කියැවෙන්නේ කේරළයන්ගේ ලේ පහරින් වාලුකා නදිය රතු වූ බවයි.මෙහි දැක්වෙන වැලි නදිය යනු මහවැලි ගංගාව යන්න බහුතර පිළිගැනීම වුවද මහවැලි ගංගාව අසබඩ එවන් කේරළ සංහාරයක් සිදු නොවීමත් මහවැලි ගඟබඩ සහ ප්‍රතිරාජ නම් යුද නායකයකු අතර (පතිරාජවරු කිහිප දෙනෙක්ම ඉතිහාසයේ සඳහන් වෙයි) සම්බන්ධයක්ද නොතිබෙන බැවින්ද එම මතවාදය බිඳ දමා, ඒ සියල්ල ගැළපෙන්නේ මාදු ගංගාවටත් දඹදෙණි යුගයේ විසූ දේවපතිරාජ අමාත්‍යවරයාටත් බැවින් මේ කාව්‍ය එම සංසිද්ධියට සාම්‍යගත කළ හැකිය. වැලි නදී යන්න මහවැලියට සේම මාදු ගඟටද දක්වා ඇති පර්යාය නාමයකි.

කිරිපෝය බවට පත්වූයේත් එකල දේවපතිරාජ අමාත්‍යවරයා විසින් සිදුකළ ඉහත ජයග්‍රහණයේ සැමරුම බවට මෙහිලා නව ප්‍රවාදයක් නිර්මාණය කළ හැකි වන අතර ඊට ප්‍රතිප්‍රවාදයක් හෝ පූර්වප්‍රවාදයක් සම්මුඛ නොවෙයි. සමජවිද්‍යාත්මකව අනුභස් නායකත්වය යන සංකල්පයෙන් කියැවෙන්නේ යම් නායකයකු අරබයා නිර්මාණය වන ජනතා ප්‍රසාදය ඉතා දැඩි භක්තිමය පදනමකින් ක්‍රියාත්මක වන බවයි. එසේම ලංකා ඉතිහාසය තුළ එවන් නායකයන් මිය ගිය පසු දේවත්වයට පත්කොට වන්දනාමාන කරන්නට පවා අප ජනතාව පෙළඹිණ. ඊට නිසි උදාහරණය මහසෙන් රජුය. සමන් දෙවියන්ද තවත් නිදසුනකි. මෙකී දේවප්‍රතිරාජ අමාත්‍යවරයා විසින් ජනතාවට නිදහස හා සාමයට අමතරව සමෘද්ධියද ලබාදුන් බව ඉතිහාසයේ කියැවේ. සුහුරුකරණය වෙමින් පැවතුණු 2009 දීත් හමුදා මෙහෙයුම් ජය සැමරුවා නම් එදාද ඒ ජයග්‍රහණය මෙම ප්‍රදේශවාසී ජනතාව උත්සවශ්‍රීයෙන් සමරන්නට ඇත යන්න විශ්වාස කළ හැකිය. එසේම එම අමාත්‍යවරයා එක්තරා කුලයක නායකයකු ලෙස සම්මානනය වී ඇත. එනයින් මෙම කිරිපෝය ඔස්සේ තම

කුලනායකයකු පිදෙන බැවින් මෙම චාරිත්‍රය එමකුලයෙහි අභිචාර විධියක් වශයෙන්ද හැඳින්වීමේ වරදක් නොමැත්තේ අදටත් එම චාරිත්‍රය ක්‍රියාත්මක වන ප්‍රදේවල සංස්කෘතික ආධිපත්‍ය එම කුලය විසින් දරන බැවිනි. එම කුලය වර්තමාන ව්‍යවහාරයේ සලාගම හෙවත් හලාගම නමින් හැඳින්වෙන අතර එම කුලවාදීන් විසින් තමන්ව සාලිග්‍රාම බ්‍රාහ්මණවංශිකයන් ලෙස හඳුන්වනු දැකිය හැකිය. එම කුලයෙහි ඓතිහාසික කෘත්‍යවී ඇත්තේ කුරුඳු තැලීම සහ යුද්ධ සේවයයි. කෙසේ නමුත් ඔවුහු පළමු අවදියේදී පේෂකාරක වෘත්තියේ නියැළී ඇත යනුවෙන්ද පිළිගැනීමක් වෙයි. දකුණු ඉන්දියාවේද සාලියාර් හෙවත් Saliyar or Saliya or Chaliyan or Sali or Sale . නමින් කුලයක් ඇති අතර ලංකාවේ සලාගම ලෙස හැඳින්වෙන කුලය සහ ඒ අතර සබැඳියාව මානවවංශ විද්‍යාත්මකව නිරීක්ෂණය කළ යුත්තකි. සලාගම ජනතාවගේ ගුණාගුණ ගැනද සමාජයේ යම් අදහස් ඇත. ඔවුන් සටනට බර, ඍජු හා දැඩි තීරණ ගන්නා එසේම වේගයෙන් හා වඩා වැඩි ශබ්දයකින් කථා කරන පිරිසක් වශයෙන් ලේබල්කරණය වී ඇතැයි කිවහොත් එහි වරදක් නැත. එසේම "හාලි හාදකං සදාකාලිකං" යනුවෙන් කවියක කියැවෙන්නේ සලාගම වංශිකයන් සමග ඇති කරගත් මිතුදම් මරණින් මතු අන් අයුරකින් නිම නොවන බවයි. කුල ක්‍රමය ඉන්දීය දායාදයක් වන අතර බ්‍රහ්මන් මිනිසා මැවීමේදී බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය හා ශුද්‍ර ලෙස මැවූ බවත් පංචම නමින් සැලකෙන අස්පර්ශනීය කුලයක්ද එම බ්‍රහ්මවාදී සමාජයේ තිබූ බවත් ඉතිහාසයෙන් විශද වෙයි. සලාගම වංශය බ්‍රාහ්මණයන්ට ඥාතීත්වයක් තිබූ බව පිළිගැනීමයි. ලංකාවට ඉන්දියාවේ සිට විවිධ අවස්ථාවල කුල ශ්‍රේණි පැමිණි අතර බ්‍රාහ්මණ වංශිකයන් පැමිණි බව කියැවෙන ප්‍රධාන අවස්ථා කිහිපයකි. ඒ අතර විජය රජුගෙන් පසු මෙරට රජකළ උපතිස්ස බමුණාගේ පුරාවෘතයද දැක්විය හැකිය. නමුත් ඔවුන් අරබයා පැහැදිලි හා වැඩි විස්තරයක් දැක ගත හැක්කේ සලාගම කොඩියේද නිරූපණය වන පොලොන්නරු යුගයේ පළමුවන විජයබාහු රජුගේ මෞලි මංගල්‍යයට පැමිණි බමුණන් සත් දෙනාය. ඔවුහු බේරුවල සිට අනුරාධපුරය දක්වා ගමන් ගෙන ඇත. පසුව රජු විසින් ඔවුන්ට මෙරට කුල කතුන් හත් දෙනෙකු විවාහ කර දී ඇත. සලාගම වංශයේද උපකුල කිහිපයකි. කෙසේ නමුත් මෙම පත්‍රිකාවේ ඒ ගැන වැඩි විස්තර දැක්වීමට අවකාශයක් නැත්තේ මෙය කුලමය සාධකය පිළිබඳ අධ්‍යයනයක් නොවන බැවින්ය.

**කිරි පෝය**

සුද්දෙ පෝය, කිරිපෝය හා දෙල්පෝය යනාදි නම් කිහිපයක් මේ උළෙල සඳහා ව්‍යවහාර වෙයි. සුද්දෙ පෝය යනුවෙන් මෙයට ව්‍යවහාර වන්නේ එය පාරිශුද්ධතා සංකල්පය මත පදනම් වූ එකක් බැවිනි. දෙල් පෝය නමින් මෙය හැඳින්වීමට හේතුව පෝය චාරිත්‍රවලින් පසු වේල් තුනක් නිර්මාංශාහාරික වීම නිසා මේ කාලයට දෙල් හොදි සහ බත් අනුභවයයි. මෙහි ප්‍රධාන චාරිත්‍රයක් වන කිරි පිසීම නිසා කිරි පෝය ලෙස ව්‍යවහාර වන බව පෙනෙයි. මෙම කිරිපෝය සැමරුම ගමේ දේවාලය කේන්ද්‍ර කරගෙන සිදු කරනු ලබන අතර එම උළෙලට අදාළ දින වකවානු නිවේදනය කිරීම වර්තමානයේ සිදු කරනු ලබන්නේ ගම පුරා දැන්වීම් ඇලවීමෙනි.

**කිරිපෝය ව්‍යූහය**

කිරිපෝය නම් ශාන්තිකර්මය සහසම්බන්ධ චාරිත්‍ර වාරිත්‍ර / අභිචාර සමූහයකි. ඒවා හඳුන්වන විශේෂිත භාෂාත්මක නාමද ඇත. කිරිපෝයෙහි ක්‍රියාකාරිත්වය මෙසේ සැකෙවින් හඳුනාගත හැකිය. ඒ අනුව මඩු ශාන්තිකර්ම විශේෂයක් ලෙසද මෙය හඳුනා ගත හැකිය

- පේ ගෙට යාම / පේ පැල් යාම

  දේවාලය භාරව සිටින කපු මහත්වරු පෝයට සතියකට පමණ පෙර යෙදෙන බදාදා හෝ සෙනසුරාදා (එම දෙදින් කෙම්මුර හෙවත් දෙවියන්ගේ දින වෙයි) දේවාලවල නවාතැන් ගැනීමට යති. ඔවුන්ට යළි තම නිවෙස්වලට ඒමට හැකියාව ලැබෙන්නේ දේව මංගල්‍යය අවසන් වූ පසුය. දේවාල භූමියේ නවාතැන් ගෙන පළමුව දේවාලය ශුද්ධ පවිත්‍ර කිරීම සිදු කරනු ලැබෙයි. කපු මහත්වරු පේ පැල් යෑම දේවාලයේ සහ නගරයේ මිනිසුන් දැනුම්වත්කිරීමට දැන්වීම් අලවනු දැකිය හැකිය. කපු මහත්වරු දේවාලයට ගිය පසු ගම්වැසියෝ තෙල්වළං ලිප තැබීමෙන් හා පිටි කෙටීමෙන් බැහැර වෙති.

- නිවස ශුද්ධ පවිත්‍ර කිරීම
  අලුත් අවුරුද්දට නිවස ශුද්ධ පවිත්‍ර කරනාකාරයෙන්ම මෙම චාරිත්‍රය අනුදත් ප්‍රදේශවල නිවෙස් පිරිසිදුකරණය අනිවාර්ය අංගයකි. මුහුදු වතුර ගෙනැවිත් ගෙබිම ඉස පිරිසිදු කිරීම සිදු කෙරෙයි.

- පඬුරු දීමට යාම

  ගම් වැසියෝ තම පවුලේ සියලු දෙනා සමගම දේවාලයට ගොස් පඬුරු දීම සිදු කිරීම කපුමහත්වරු පේ ගෙට ගිය පසු සිදු කරනු දැකිය හැකිය. දේවාලයට යාමට මත්තෙන් ස්නානය කොට නළලෙහි දෙහි ගෑම සිදු කරනු ලැබේ. අනතුරුව බෙලිකොලයක් කඩාගෙන එහි තම නිවසේ සිටින සාමාජිකයන් සංඛ්‍යාවට අනුරූපව කාසි තබනු ලැබේ. කහදියරෙන් සෝදාගත් එම කාසිවල දෙහි යුෂ ආලේපනයද දැකිය හැකිය

- රූපයට රූපයක් ගැනීම

  දේවාලය අබියස කුඩා ස්ථානයක රූප අලෙවි කිරීම දැකිය හැකිය. එහි රූප යනු පිත්තලවලින් තැනූ කුඩා මිනිස් රූප, නිවාසවල රූප හා යාන වාහනවල රූපය. තම නිවැසියන් ප්‍රමාණයට ඒවාද මිලදී ගෙන ඉහත කී බෙලි කොළයෙන් තැනූ ගොට්ටට එකතු කරනු ලැබෙයි

- බුදුන් වැඳීම
  දේවාලය අබියස පිහිටි බෝධිය අසළට ගොස් මල් පහන් සුවඳ දුම් පුදා බුදුන් වැඳීම පළමුව සිදු කරනු ලැබේ

- රූප පඬුරු ඔප්පු කිරීම
  අනතුරුව රූප පඬුරු භාර ගනු ලබන දේවාලයට ගොස් (එය ගම් මඩුවක් ලෙස දැකිය හැකි නමුත් ඒ සඳහා දැන් ස්ථිර ස්ථානයක් ලෙෂ සකසා ඇත)කපු මහතා පැමිණෙන තුරු බැතිමත්හු පෝලිමේ සිටිති. කපු මහතා පැමිණි පසු කපු මහතා අතට ඉහත කී බෙලි කොළය යම් කිසි මුදලක් සමග කපු මහතාට ලබා දීම සිදු කරයි. අනතුරුව සියලු දෙනාම එම දේවාලයේ අසුන් ගනිති. ඉන්පසු කපු මහතා පිරිසට ආශීර්වාද කරමින් යාතිකා කරති. එය අවසානයේදී කහදියර ගෙන අසුන් ගෙන සිටින සියලු දෙනාගේම හිසට ඉහළින් එම ජලය ඉසිනු ලැබෙයි. අල්ලිය ආරච්චිලා කෝවිලේ පූජාව ලෙසද මේ ඇතැම් තැන්වල හැඳින්වෙයි.
- සලං සැලීම
  ඉහත චාරිත්‍රයෙන් පසු ඒ අසළ ඇති මහා දේවාලයට ගොස් බැතිමත්හු අසුන් ගනිති. කපු මහතා විසින් රතු සාටකයක් පැළඳ දකුණතෙහි ගෙජ්ජි සහිත වළල්ලක් ගෙන එය සෑම දෙනාගේම හිසට ඉහළින් සලමින් යාතිකාව සිදු කරනු ලැබේ. වමතින් ඔහු ගෙන එන බඳුනට කාසියක් දැමීමද මෙහිදී බැතිමත්හු විසින් සිදු කරති.

- මහාකාලපන්දමේ පඬුරු බැඳීම
  දේවාල භූමියෙහි පුවක් ගසක් කපා ඔසවා ඇත. එය කාලපන්දම ලෙස දේව මංගල්‍යය දා දල්වනු ඇත. එම ගසෙහි රෙදි පටිවලින් පඬුරු ගැටගසිමින් භාරහාර වීම දැකිය හැකිය. එනම් තම තමන්ගේ සිතුම් පැතුම් ඉටුවන ලෙසයි

- දේවාල භූමියේ සිදුකරනු ලබන විවිධ කාර්යය

  මේ දේවාල භූමියට පැමිණීම කුඩා දරුවන්ටද විනෝදජනක අවස්ථාවකි. කුඩා දරුවන්ට සෙල්ලම් බඩු හා හිම කිරම අලෙවි කිරීමද දේවාල භූමිය අසළ දැකිය හැකිය. එසේම දේවාලයේ සංවර්ධනයට හැකි පමණින් ටිකට් පතක් ගෙන දායක වීමද එම ටිකට් පත්

ගන්නා අයගෙ නම්ගම් ශබ්ද විකාශනයෙන් කියා ආශිර්වාද කිරීමද මේ හා දැකිය හැකිය. ඊට අමතරව පෞද්ගලික භාරහාර වීම් සහ රෝගාතුර වූ අය ඇප නූල් බැඳ ගැනීම ආදියද සිදු කරනු ලැබෙයි.

- අලුත් උපකරණ ගැනීම
  දේවාලය අසළ පිහිටි මෙම උත්සවයටම තනනු ලැබූ තාවකාලික වෙළෙඳහල්වල අලුත් හට්ටි මුට්ටි වළං සහ හැඳි ආදිය මිලදී ගැනීමද බැතිමත්හු සිදු කරති. ඒ පොහෝ දින දේවදානය පිසීම පිණිසය.
- අලුත් දැක්ම රැගෙන ඉස්සර බැලීම
  ගමේ බැතිමතුන්ගේ පඬුරු රැගෙන පෝයට දින දෙකකට පෙර කපු මහතුන් කතරගම් නුවර බලා පිටත් වෙයි. එහිදී ගම පුරා කපු මහතුන් සංචාරය කරනු ලබන අතර එහිදීද ගැමියෝ පඬුරු ආදිය ලබා දීම සිදු කරති.එම චාරිත්‍රය හඳුන්වන්නේ හමාර පඬුරු දීම යන නමිනි. අනතුරුව බස්රථවලින් කතරගමට පිටත්වන කපු මහත්වරු සහ ගමේ දායකයෝ ඒ අතර මග සීනිගම දේවාලයට ගොස් ආශිර්වාද ගැනීමට අමතක නොකරති.

## කිරි පෝය දිනයේ චාරිත්‍ර

- පහන් පැල / මල් පැල සකස් කිරීම

  නිවසේ දොරටුවට මුහුණ පා ගොක් කොළවලින් පැළක් සකස් කිරීම සිදු කෙරෙයි. පහන් පැල බිම මුහුදු වැලි අතුරාලීමද දැකිය හැකිය.
- කිරි සැකසීමට පූර්ව ක්‍රියාකාරකම්

  පෝදින උදේ සිටම සවස සිදුකරනු ලබන අභිචාරය වෙනුවෙන් නිවැසියෝ පේ වී කටයුතු කරති. ආහාරවලට අවැසි පිටි ආදිය නිවසේම කොටා ගැනීම සිදු කරයි. සන්ධ්‍යාභාගයේදී කිරිබත් සමග කිරියා හෙවත් කිරි කැකැරුම් පිස ගැනීම සිදු කරයි. සීනි පැණි හකුරු ගින්නෙන් උණු කර ගම්මිරිස් මුද්දරප්පලම් ආදි ද්‍රව්‍ය යොදා හාල්පිටි යොදාගනිමින් මෙම මිශ්‍රණය තනයි. හික්කඩුව ප්‍රදේශයේ බත්සමග මුරුංගා හෝ තක්කාලි සම්බෝල පිසිනු ඇතැම් විටෙක දැකිය හැකිය. සකසනු ලබන මෙම දේවදානයේ රස බැලීමක් සිදු නොකරනු ලැබෙයි. ඇතැම් නිවෙස්වල මෙම චාරිත්‍රය ඉටු කිරීමටම පොල් සපයා ගැනීමට වෙන්වූ පොල්ගසක් අතීතයේ තිබී ඇත.
- ආහාර ගොට්ට / දං ගොට්ට පිදීම
  කිරිබත් සහ කිරි පිසගත් පසු කෙසෙල් කොළවලින් ආහාර ගොටුවක් සකසා එහි කිරිබත් කිරි සහ කෙසෙල් ගෙඩියක් තැන්පත් කර තනාගත් පහන් පැලේ තබයි. පඬුරක්ද සමග මල් සුවඳදුම් පුදා පහනක් දල්වා සුදුවතින් සැරසුණු පවුලේ සැවොම එක්ව බුදුන් වැඳ දෙවියන්ට කන්නලව්වක්ද සිදු කරයි. සමහරෙක් පහන වෙනුවට විලක්කුවක් සකසා එය දල්වති. අහුංගල්ලේ දේ සු ද සොයිසා දක්වා ඇති පරිදි එම දේව කන්නලව්ව මෙසේය

> උතුම් වූ කතරගම ස්කන්ධකුමාර මහාසේන දිව්‍ය රාජෝත්තමයාණන් වහන්ස, අප වෙසෙන ශ්‍රී ලංකාද්වීපයේ රුහුණ දනව්වට දක්ෂිණ දේශයට බැල්ම හෙළාගෙන තෙද බල පතුරුවාගෙන වැඩ වාසය කරන ඔබ වහන්සේ සත්‍යයයි. ඔබ වහන්සේට මෙම නිවසේ සිටින අහිංසක අප සියලු දෙනා විසින් ඉතාමත් ශ්‍රද්ධාවෙන් භක්තියෙන් යුතුව නොඉඳුල්ව පිරිසිදුව සකසා පූජා කරන මෙම දේව දානය පූජා කරමි පූජා වේවා. අප වෙත අනුකම්පාවෙන් මේ දේවදානයද අපි අනුමෝදන් කරන සියලු පින් කුසල්ද ඔබ වහන්සේට අනුමෝදන් කරමි අනුමෝදන් වේවා. උතුම් දිව්‍ය රාජෝත්තමායාණන් වහන්ස, අද මේ සුද්දෙ පෝය දවසේ අප පරම්පරා ඥාති සමූහයා විසින් ඈත අතීතයේ සිට ඔබ වගසේම ගරු සැළකිලි කරනු වස් සිදුකරන මේ උත්තම දේව පූජාව අපිද නොකඩවා පවත්වාගෙන එමින් ඔප්පු කරමු. දෙවි මහා

රජාණන් වහන්ස ඔබ වහන්සේ මේ සියල්ල පිළිගෙන ඔබ වහන්ස දිව්‍ය ශ්‍රී සම්පත් වර්ධනය වී ප්‍රාර්ථනා කියා බෝධියකින් නිවන් සුව අවබෝධ කර ගන්නා සේක්වා.

උතුම් වූ දිව්‍ය රාජයාණනි, ඔබ වහන්සේ විසින් අප පවුලේ සියලු දෙනාත් දූ දරු කිරි සප්පයනුත් ගෙවල් දොරවල් හරකා බානද වෙළෙහෙළඳම්කර මාන්නද ඉඩ කඩම් දෙල් පොල් කොස් ආදී පලතුරු ගස්ද විවිධ ලෙඩ රෝග අතුරු ආන්තරාවලින් බේරා ගෙන තව තවත් වැඩ වඩන්නට අපට ශක්තිය ලබාදෙන සේක්වා. එමෙන්ම අප ගම් කොරටුවද වෙහෙර විහාර පන්සල බෝධියද පැවිදි පිරිසද ගුරුවරුන් හා වැසියන් ඇතුළු රුහුණු දනව්වත් මුළු ශ්‍රී ලංකා ද්වීපයත් දිවැස්හෙළා රක්ෂා කරදෙන සේක්වා. සාදු සාදු සාදු

- ජොරා මැරීම
  ආහාර ගොට්ට පිදීමෙන් පසු නිවැසියෝ සියලු දෙනාම සාලයට එක්රැස්ව පැදුරක් එලා ගනියි. එතැනද පහනක් දල්වයි. සැකසූ කිරි ආහාර අනුභව කරන්නේ කෙසෙල් කොළවලය. ගෘහ මූලිකයා විසින් සැකසූ ආහාර පවුලේ සාමාජිකයන්ට බෙදා දීම සිදු කරයි. ඉන්පසු තවත් කෙසෙල් කොළයකට එම ආහාර බෙදා මළගිය ඥාතීන් වෙනුවෙන් වෙන් කරයි. එය දේව දානය අනුභවයෙන් පසුව උස් ස්ථානයක තබයි. ආහාර බේදීමේදී "ඇති" යනුවෙන් නොකියන අතර ඒ වෙනුවට "කරුණාවයි" යනුවෙන් පැවසීමද සිරිතකි. මේ අවස්ථාව හැඳින්වෙන්නේ ජොරා මැරීම යනුවෙනි එසේම ඇතැම් නිවෙස්වල නැකතට ඉඳුල් කටගා නොමැති දරුවන්ට මුල්ම ආහාරය දෙනු ලබන්නේද මේ අවස්ථාවේදීය.
- ගොටු ඉස්සීම
  එදින රාත්‍රියේ ගමේ තරුණ උදවිය ගෙයින් ගෙට ගොස් ගොටු ඉස්සීම සිදු කරයි. එනම් පහන් පැලේ තිබෙන ගොටු සොරකම් කිරීමයි. සොරකම වැරදි ක්‍රියාවක් වුවද මෙදින එම ක්‍රියාව වරදක් ලෙස නොසලකන නිසා නිදහසේ දේව පූජාව සොරා ගෙන අනුභවය දැකිය හැකිය
- දේව දානය බෙදීම
  පසුදා එම දේව දානය රැකී රක්ෂා කරන ස්ථානවලට ගෙන යාමද මෙම චාරිත්‍රානුගත බැතිමතුන් සිදුකරනු ලබන ක්‍රියාවකි.

  මෙම රාත්‍රියෙන් පසු ආහාර වේල් තුනක් නිර්මාංශාහාරිකව ගත කිරීමටද ගම්වැසියෝ කටයුතු කරති.

**දේවාලයේ උත්සවය**

පොහෝ දිනයට පසුදා දේවාලයට රැස්වන බැතිමතුන් දේවාලය තුළම දේව දානය පිසීම දැකිය හැකිය. එම දේව දානය ඉඳුල් කිරීමෙන් හෙවත් අනුභවයෙන් නිරෝගී සුවය ලැබේ යැයි විශ්වාසයක් ඇත. එදින රාත්‍රියේ කාවඩි නටා, ගිනි පාගා, මහාකාලපන්දම් දල්වා විවිධ නැටුම් (පත්තිනි නැටුම්, තෙල්මේ නැටුම්, දෙවොල් නැටුම්) පවත්වා දේවාලයේ මහපූජාව පවත්වා සියලු පුද පූජා අවසන් කරනු ලැබේ. එය සැබැවින්ම සැණකෙළියක් බඳුය. ගම්වැසි සියලු දෙනාම එකට එකතු වන අවස්ථාවක් වශයෙන් මෙය දැකිය හැකිය. ඉන් සතියක් යාමට පෙර දේවාලයේ පෙරහැර දිවා රාත්‍රී වශයෙන් වීදි සංචාරය කරනු ලබන අතර උඩරට, පහතරට, සබරගමු ආදී සියලු සම්ප්‍රදාය නියෝජනය වන පරිදි විවිධ අංගවලින් එම පෙරහැර විචිත්‍ර වෙයි. අලි ඇතුන්ද ගමන් කරන එම පෙරහැරේ විශේෂත්වය වන්නේ එක් එක් දෙවිවරුන්ගේ පිළිරූ ඇතුළත් රථ වීථි සංචාරය කිරීමයි. එම පිළිරූවලට කාසි දමමින් ගම්වැසියෝ ආශීර්වාද ලබාගන්නා අතර අවට ප්‍රදේශවාසීහුද පෙරහැර නැරඹීමට පැමිණෙති.

මෙම චාරිත්‍ර ඉටු කිරීමේදී කිලි හසුවීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කිරීමද දැකිය හැකිය. තදාසන්න කාලයේ අවමංගල්‍යයක් සිදුවූ හෝ දෙවියන්ගේ ලෙඩ නමින් හැඳින්වෙන පැපොල කම්මුල්ගාය සරම්ප වැනි රෝගීන් සිටින නිවෙස්වල මෙම සිරිත ඉටු නොකෙරේ. එසේම අභිචාරවල ප්‍රතිඵල සාධනීයව ලබා ගැනීමට අවශ්‍ය නම් පවිත්‍රත්වය හා කිල්ල ගැන සංවේදී විය යුතු බව සමාජ අදහස බව සමාජ විද්‍යාඥයන් පෙන්වා දී ඇත. (හේමන්ත කුමාර 2015)

මෙනයින් සලකනවිට කිරිපෝය සමාජමය සුකෘත්‍යයක් ඉටු කරන්නක් වන අතර වාස්තවික හා අර්ථකථනාත්මක සහ බහුවිධ සමාජවිද්‍යාත්මක පර්යාවලෝක ඔස්සේ පුළුල් ක්ෂේත්‍රයක තවදුරටත් විමර්ශනයට නතුවිය යුතු සමාජ ප්‍රපංචයක් බව ස්ඵුට වෙයි. මෙම අපූර්ව උත්සවය පිළිබඳ විමල් අභයසුන්දර විසින් රචිත කවි පංක්තියක්ද මෙසේය. එයින්ද මෙම සිරිත් විරිත් සමුච්චය රසවත්ව නිරූපිතය.

සිහිපත් කරවමින් පෙර සුර - අසුර යුද
ගම්මානයට පායන විට ඇසළ සඳ
වැලිතොට විසූ බමුණන්ගේ සිරිත ලෙද
ඇරඹෙයි සුද්දෙ පෝයට කඳ සුරිඳු පුද

ගෙය දොර මිදුල වතුපිටි සැම කල් ඇතිව
මැනවින් සුපිරිසිදු කොට ගෙන දැනුමැති ව
කුල දෙවියන් පුදනු සඳහා හද බැති ව
සැරසෙනු සිරිනි කිසි පසු බැස්මක් නැති ව

කළයක් පුරා කරදිය ගෙන වගුල බිම
ඉසිමින් කහදියර අහුමුළු නොනක හැම
පොල්තෙල් පහන් දී අල්ලා සුවඳ දුම
පිළිවෙත් පවත්වති ලෙස කුල සිරිත තම

ගොක්කොළ වලින් මල්පැල අලුතින් සාදා
කිරිබත් ගොටුව වෙසෙසින් තුන්සිත පාදා
දල්වා විලක්කුවආලෝකය වීදා
දෙවියන් පුදති පළමුව සුද්දේ පෝදා

සුද්දේ පෝය ඇසළෙහි පුණු පොහොදා ට
පිළිහඩු නුමුසු කිරිබත සැපයෙයි රැට
හකුරුද කිරි කැකෑරුම් මුසුවෙයි ඊට
දෙවි පුද මහා උළෙලකි ගැමි ජනයා ට

පවතින කතරගම උළෙලට උචිත ලෙස
වතු කොළවල බෙදා කිරිබත හොඳට පිස
වැඩිහිටි පිළිවෙළට නිවසෙහි පිරිමි පස
හිඳගෙන පැදුරු මත පළමුව විඳිති රස

**සාරාංශය හා නිගමනය**

පළමුව දැක්වූ න්‍යාය කිරි පෝයට ආදේශකරණය කළහොත් මෙසේ වගුගත කළ හැකිය

මහේක්ෂ

| වාස්තවික | | | මනෝමූලික |
|---|---|---|---|
| | සාමූහික විඥ්ඤාණය (collective conciouseness) ඇති වෙයි | ගමේ සහ පරිසරයේ සමෘද්ධිය ප්‍රාර්ථනා කෙරේ | |
| | නිවස හා පවුල තුළ සමාජානුයෝජනය (socialization) සිදු වෙයි | පෞද්ගලික හා ජීවන අභිවෘද්ධිය අපේක්ෂා කරයි | |

සූක්ෂ්ම

මෙම අභිචාර ඉටු කිරීමෙන් ගම්වැසියන් සහ ප්‍රදේශවාසීන් අතර අන්‍යෝන්‍ය සහසම්බන්ධය අලුත් වෙයි. එමගින් සමාජ අනුකලනය ඇතිවීම දැකිය හැකිය. එසේම ඒ ඔස්සේ ආගමික සංස්ථාව කෙරෙහි සමාජමය වශයෙන් ඇති යුතුකම් ඉටුකිරීම දැකිය හැකිය. තවද සමස්ත ප්‍රදේශයම එකම අභිලාෂයකින් කටයුතු කිරීම දැකිය හැකිය. දේවාලයේ උත්සවය පිළිබඳ දැන්වීම දුටු පසු එය එකිනෙකනා අතර සන්නිවේදනයෙන් සුහදත්වය අලුත් වෙයි.එසේම දේවාල පෙරහැරට ගමේ සියලු දෙනා හැකි තරමින් මුදල් ආදිය ලබා දෙයි. එසේම එය නැරඹීමටද යති. එමගින් සමාජමය කෘත්‍යයක් සිදු වෙයි.

මෙම උළෙල තුළ පවුල් සංස්ථාවේ සමාජානුයෝජනය සිදුවෙයි. මෙය වාර්ෂික උත්සවයක් බැවිනි. පවුලකට සාමාජිකයන් එකතුවීම ආකාර දෙකකින් සිදුවෙයි.

1 ආවාහ විවාහ ඔස්සේ නව සාමාජිකයන් බද්ධ වීම

2 ප්‍රජනන කෘත්‍ය ඔස්සේ දරු දැරියන් එකතු වීම

මේ අනුව නිවසට අලුතෙන් එකතුවන සාමාජිකයන් මේ උත්සවයට සහභාගි වීමෙන් මෙම අභිචාරය පරම්පරාවෙන් පරම්පරාවට නොසිඳී යාවත්කාලීන වෙයි. වෙසෙසින්ම මේ චාරිත්‍රය නොමැති ප්‍රදේශවලින් විවාහ වී පැමිණෙන කාන්තාවන්ද මේ චාරිත්‍රයට හුරු වෙයි. එසේම විසුරුණු පවුලේ සාමාජිකයන් මේ අවස්ථාවට එකතු වීම ඔස්සේ ඥාතිබන්ධුත්වය තහවුරු වෙයි. මේ කරුණු කිරිපෝය ආශ්‍රිත වාස්තවික සිද්ධි වශයෙන් හඳුනා ගත හැකිය. කිරිපෝය සම්බන්ධ අභිචාර සමාජමය රීතිබවට ක්‍රියාත්මකවීමත් එයට අනුරූපව සමාජ පර්යාය හා ක්‍රියාකාරකම්/ අන්තර්ක්‍රියා වෙනස්වීමත් එහිලා විශේෂයෙන්ම නිරීක්ෂණය කළ හැකි ප්‍රපංච වෙයි.

මෙම අභිචාරය ඉටු කිරීමෙන් ගමට ස්වභාවික ආපදා පැමිණීම වැළකීම සහ වසංගත රෝගාදිය බෝවීමෙන් ආරක්ෂා වීම සිදුවෙතැයි ගැමියෝ අපේක්ෂා කරති. එසේම දෙවියන්ට කරනු ලබන යාතිකාවේදී කපු මහතුන් සිහිපත් කරනුයේ ඔබ වහන්සේගේ ගම් කොරටුවල වාසය කරනු ලබන නරයන් ආරක්ෂා කර දෙන ලෙසයි.

එසේම පෞද්ගලික වශයෙන්ද තමතමන්ගේ අරමුණු ඉටුකරගැනීමට මේ අවස්ථාවක් බවට පත්වෙයි

- ඇස්වහ කටවහ හෝවහ ආදියෙන් ආරක්ෂා වීම
- අණවිණ කොඩිවිණ බන්ධන හූනියම් ආදියෙන් ආරක්ෂා වීම

- රැකී රක්ෂා කටයුතු, වෙළඳාම් දියුණු වීම
- අධ්‍යාපන කටයුතු ආදිය සාර්ථක වීම
- දරුඵල ආදී අපේක්ෂා ඉටු වීම
- රෝග පීඩාදියෙන් මිදීම

යනාදී පෞද්ගලික අපේක්ෂා ඉටු කරගැනීම මෙම අභිචාරය ඉටු කිරීමෙන් බැතිමත්තු අපේක්ෂා කරති. තවද මානසික සංහිඳියාව, සතුට හා විවේකය යනාදී මනෝවිද්‍යාත්මක ආශ ඉටුකරගැනීමට මේ කදිම අවස්ථාවකි. එනයින් ගත්කල සාර්ව හා ක්ෂුද්‍ර වශයෙන් මනෝමූලිකව සමාජවිද්‍යාත්මක කෘත්‍යයක් මෙමගින් ඉටු කෙරෙයි. ඒ අනුව සාර්ව වශයෙන් ධර්මතා සහ ඇගයුම්ද ක්ෂුද්‍ර වශයෙන් විශ්වාස හා සංජානනද කිරිපෝය මංගල්‍ය හා බැඳී පවතියි.

කතරගම දෙවියන් කේන්ද්‍ර කරගත් මෙම උළෙලෙහිදී ගම්භාර දෙවියන්, දැඩිමුණ්ඩ දෙවියන් හා පත්තිනි දේවතාවියන් සිහිපත් කිරීමද දේවාලවලදී සිදු කෙරෙයි. මුල්බුදුදහමේ දේවතා වන්දනය නොදැක්වෙන නමුත් දෙවියන්ට පින්දීම දේවතා බලි වශයෙන් දක්වා ඇත. තවද කතරගම ආදී දෙවිවරු හින්දු දහමෙහිද පැන නැඟෙයි. එනයින් ගත්කල මෙම ශාන්ති කර්මය බුදුදහම තුළ දේවාගම සාමයිකව ක්‍රියාවට නැංවීමකි. එමගින් ඒ අතර අතිපිහිත වීමක්ද දැකිය හැකිය. එසේම බෞද්ධ ලෝක දෘෂ්ටියේ බුදුන් දෙවියන් ග්‍රහයින් යක්ෂයන් ප්‍රේත පිසාචාදීන් කේන්ද්‍රකරගත් ප්‍රබල යාතුකර්ම සම්ප්‍රදායක් ඇති බව සමාජවිද්‍යාඥයෝ පෙන්වා දෙති. (ප්‍රේමකුමාර 2018, අතුකෝරාළ 1985)

කිරිපෝය ඔස්සේ සිංහල බෞද්ධ ලෝක දෘෂ්ටියට ( Sinhalese Buddhist weltanschauung) අදාළ සංරචකවල භාවිතය මෙසේ සංකේතවත් කළ හැකිය

බුදුහිමි ( දේවාලයට ගොස් පළමුව බුදුන් වැඳීම)

↑

කතරගම දෙවියන් (බැතිමතුන්ගේ පුද පඬුරු කතරගම ගොස් ඔප්පු කිරීම)

↑

දෙවොල් දෙවියන් (කතරගම යන අතරතුර සීනිගමදී දෙවොල් දෙවියන් බැහැ දැකීම)

↑

ගම්භාර දෙවියන් / පත්තිනි මෑණියන් (මෙම පූජාවේදී ඒ ගමට භාරව සිටින ගම්භාර නමින් හැඳින්වෙන දෙවියන්ද පත්තිනි මෑණියන්ද සිහිපත් කිරීම දැකිය හැකිය)

සමාජ හා මානව විද්‍යාවල අභිචාර/යාතුකර්ම වර්ගීකරණය කර ඇති ආකාරත්‍රයකි

1 ආරක්ෂාකාරී (protective) අභිචාර/යාතුකර්ම

2 නිෂ්පාදක (productive) අභිචාර/යාතුකර්ම

3 විනාශකාරී (distructive) අභිචාර/යාතුකර්ම

කිරිපෝය ශාන්තිකර්මය ඔස්සේ 1 සහ 2 යන අභිචාර/යාතුකාර්මික සංසිද්ධි ඉටුවීම දැකිය හැකිබව මෙනයින් නිගමනය කළ හැකිය. මෙම පොහොය ශාන්ති කර්මය බෙන්තර ගංගාවේ සිට ගිං ගංගාව දක්වා මුහුද තදාසන්නව ජීවත්වන සැලකිය යුතු තරමේ ජනතාවක් සහභාගී වන උත්සවයක් බැවින් එය පිළිබඳ සමාජවිද්‍යාත්මක, මානවවිද්‍යාත්මක, සන්නිවේදන හා සංස්කෘතික

අධ්‍යයනවලට නිමිත්තකි. එසේම මෙය මනෝවිද්‍යාත්මකවද විග්‍රහ කළ හැකිය. කිරිපෝය ශාන්තිකර්මය මනසට ගෙන දෙන වෙනස (change) තරගකාරී හා ඒකාකාරී ජීවන රටාවට අපූර්ව අත්දැකීමක් ගෙන දෙනු ඇති අතරම මෙම මංගල්‍යය වටා බැඳි චාරිත්‍ර වාරිත්‍රවල විචිත්‍රත්වය සහ ලංකෘතත්ත්වයද පර්යේෂකයන් උනන්දුකරනවා ඇත.



**ආශ්‍රිත මූලාශ්‍රය**


අතුකෝරාළ, කරුණාතිස්ස (1985) විශ්වය පිළිබඳ මතය හා සමාජ ව්‍යුහය ගැන ග්‍රාමීය බෞද්ධයන් ආශ්‍රිත විමර්ශනයක්, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, සමාජ විමසුම. (පි 149-173)

අභයසුන්දර, විමල් (1999) සුදු වැලි තලාවේ ගුම් නැගෙන සෙල් ගී, කොළඹ : ගොඩගේ.

අබේවික්‍රම, ප්‍රණීතා. (2007 ජූලි 29) බොදු සමාජයේ වැඩි දෙනෙකු නොදන්නා කිරිපෝය අදයි, ලක්බිම ඉරිදා සංග්‍රහය.

කාරියවසම් කේ, කේ, පී, එන්. (2007) ශ්‍රී ලංකාවේ වැලිතර-බළපිටිය ප්‍රදේශයේ ප්‍රචලිත කිරිපෝය ශාන්ති කර්මය, *Proceedings of the Annual Research Symposium* 2007 - *Faculty of Graduate Studies, University ofKelaniya*

ද සිල්වා, ප්‍රේමකුමාර. (2018) සිංහල ගැමි සංස්කෘතික යාතු කර්ම සම්ප්‍රදායන් පිළිබඳ සමාජ-මානව විද්‍යාත්මක ඇගයීමක් , මුඛ්‍ය දේශනය ,සිංහල ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය, කොළඹ විශ්වවිද්‍යාලය (මුද්‍රිත දේශනයකි)

දේ. සු. ද සොයිසා.(2010 ජූලි 21) ඇසළ පෝයටම උදාවන සුද්දෙ පෝය, දිවයින පුවත්පත.

නාලක ජයසේන. (2017 අගෝස්තු 7) ජොරා මරන සුද්දෙ පෝය, රිවිර පුවත්පත.

නාලක ජයසේන (2017) කිරිපෝයෙහි සමාජ විද්‍යාත්මක පදනම පිළිබඳ අධ්‍යයනයක්, ජනශ්‍රැති පිළිබඳ දෙවන පර්යේෂණ සමුළුව, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

හේමන්ත කුමාර, එන්. වී. පී. ඒ. (2015) සමාජවිද්‍යා ප්‍රවේශය, මාතර : රුහුණු අධ්‍යයන කවය.

Ritzer, G.2012.Sociological Theory. 8th ed.London:McGraw-Hill Education




කිරිපෝය ශාන්තිකර්මය පිළිබඳ ජනතාව දැනුවත්කරන දැන්වීම් දෙකක් (පුරාණ මෝදර මහා දේවාලය සහ වැලිවත්ත පුරාණ පත්තිනි කෝවිල) මෙම දැන්වීම් දෙකෙහිම මෙම සිද්ධස්ථානවල ආරම්භය දේවපතිරාජ අමාත්‍යවරයාගේ කාලයේ බව කියැවෙයි.